*සැ. යු.* —2024.10.25 දින පළ කරන ලද අංක 2408 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,409 - 2024 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2024.11.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස : අධිකරණ

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | 458 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 නොවැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

457- B 82623 —563 (2024/11)
C1-

# පිස්කල් විකිණීම්

## කොළඹ දිසා අධිකරණයේ දී ය

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

................පැමිණිලිකරු.

නඩු අංකය : DMB/268/2019
ඇස්කිසි අංකය : 21/22
ස්වභාවය : මුදල්
වටිනාකම : රු. 6,968,892.44

*එදිරිව*

අබේවර්ධන ආරච්චිගේ පහන් දිලංක,
අංක 3395, නුගේ හරස් පාර, මොරකැටිය, ඇඹිලිපිටිය,

*සහ දැනට :*

මහානාම කලර් හවුස්, මොරකැටිය පාර,
පල්ලේගම, ඇඹිලිපිටිය.

*...................විත්තිකරු.*

වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 11 වන කොළඹ දිසා අධිකරණයේ ඇතුළත් කරන ලද ඒක පාර්ශ්වීය තීන්දු ප්‍රකාශය අනුව පළවන විත්තිකරු විසින් පැමිණිලිකාර සමාගමට රුපියල් හැට නව ලක්ෂ හැට අට දහස් අටසිය අනූ දෙකයි ශත හතලිස් හතරක (රු. 6,968,892.44) ක මුදල හා ඒ මත පොළිය ගෙවීමට පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබා දෙන ලෙසත් (ආ) විත්තිකරු ඉහත රුපියල් හැට නව ලක්ෂ හැට අට දහස් අටසිය අනූ දෙකයි ශත හතලිස් හතරක (රු. 6,968,892.44) ක මුදල හා නෛයිතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඉරෝෂනි ජේ. රත්නායක මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 04 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසත් (ඇ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2022/03/08 වැනි දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තර ව දක්වා ඇති නිශ්චල දේපළ.

**වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 28 දින පෙ. ව. 11 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 214/ඒ පල්ලේගම ග්‍රාම නිලධාරි වසම තුළ, පල්ලේගම ඇඹිලිපිටිය ග්‍රාමයේ පිහිටි ''පන්සලේ වත්ත'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ මහතා විසින් මැන සාදන ලද අංක 213 සහ 1981.07.13 දින දරන පිඹුර ප්‍රකාර ලොට් සී සඳහා මායිම්, උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : හින්නි මහතාට අයත් ඉඩම ද, දකුණට : කාණුව ද, බටහිරට : එස්. රත්නායකට අයත් ඉඩම ද, යන මායිම් වූ ප්‍රමාණයේ පර්චස් හතයි දශම හයයි බින්දුවක් (පර්. 7.60) ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ පලතුරු ආදී සියලු දේ ද, මෙම ඉඩම ඇඹිලිපිටිය ඉඩම් ලියා පදිංචි කාර්යාලයේ පත්ඉරු L/140/70 හි ලියා පදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතුය.
2. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.
3. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ඇඹිලිපිටිය.

වර්ෂ 2024 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින දී ය.

11-06

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනැන්ස් කම්පැනි පී.එල් සී.
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

*............පැමිණිලිකරු.*

නඩු අංකය : DMB/350/19
ඇස්කිසිඅංකය : 112/2004
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 2,072,139.69

*එදිරිව*

බටුවත්ත ගමගේ නිමල් දසනායක,
අංක 39/3, පහළ කරගහමුණ,
කඩවත.

*................විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2023 ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින ඇතුළත් කරන ලද ඒක පාර්ශ්වික තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරුට විරුද්ධව තීන්දු ප්‍රකාශ කර ඇති අතර,

(අ) ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් විසි ලක්ෂ හැත්තෑ දෙදහස් එකසිය තිස් නවයයි ශත හැට නවයක (රු. 2,072,139.69) මුදල හා ඒ මත පොළිය ගෙවීමට පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබාදෙන ලෙසටත්,

(ආ) විත්තිකරු ඉහත රුපියල් විසි ලක්ෂ හැත්තෑ දෙදහස් එකසිය තිස් නවයයි ශත හැට නවයක (රු. 2,072,139.69) මුදල හා නෛතික පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ ටී. ඩී. එෆ්. ඒ. ගුණවර්ධන මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 3859 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසටත්,

(ඇ) නඩු ගාස්තු ලබාදෙන ලෙසත්, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2024 ක් වූ 07 වන මස 17 වැනි දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තර ව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 25 වැනි දින ප. ව. 12.30ට,**

ඉහත නම් සඳහන් විත්ති කරුගේ නිශ්චල දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, ගම්පහ ලියාපදිංචි කොට්ඨාසයේ මහර ප්‍රාදේශීය සභා සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළ කරගහමුණ බටහිර - 249 බී ග්‍රාම නිලධාරී වසම තුළ මහර පහළ කරගහමුණ පිහිටි 'මිල්ලගහවත්ත' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ මහතා විසින් මැන සාදන ලද අංක 58/1992 සහ 1992.01.30 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 සඳහා මායිම්, උතුරට : ඩබ්ලිව්. ඒ. සයිමන්ගේ ඉඩම ද. නැගෙනහිරට : පාර (අඩි 8 - අඩි 4 ද) දකුණට : ලොට් 02 ද, බටහිරට : වනිගසේකරගේ ඉඩම ද යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටක (පර්. 08) අංක 58/1992 දරන පිඹුර ප්‍රකාරව සහ ඒ තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. (මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M/540/04 හි ලියාපදිංචි කර ඇත.)

ඉහත කී ඉඩම නැවත මැනීමකට අනුව පහත දැක්වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, ගම්පහ ලියාපදිංචි කොට්ඨාසයේ මහර ප්‍රාදේශීය සභා සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළ කරගහමුණ බටහිර - 249 බී ග්‍රාම නිලධාරී වසම තුළ මහර පහළ කරගහමුණ පිහිටි කඩවත පාර අංක 276/5 දරන 'මිල්ලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද අංක 7194 සහ 2004.09.11 දින දරන පිඹුර ලොට් අංක 1 සඳහා මායිම්, උතුරට : ඩබ්ලිව්. ඒ. සයිමන්ගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : අඩි පාර (අඩි 4) ද, දකුණට : එල්. එම්. ඇනා මරියාට අයිති ඉඩමද, බටහිරට : එල්. එම්. ඇනා මරියාට අයිති ඉඩම ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටක (පර්. 08) අංක 7194 දරන පිඹුර ප්‍රකාරව ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතුය.
(2) ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.
(3) රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මහර.

වර්ෂ 2024 ක් වූ 10 මස 04 වැනි දින දී ය.

11-07

---

**ගම්පහ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. **2085,** කොළඹ **02**.

*සහ*

අංක **27,** රණතුංග පාර, ගම්පහ.

...................*පැමිණිලිකරු.*

නඩු අංකය : **264/**MB
ස්වභාවය : *උකස්*
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 790,580.34
ඇස්කීසි අංකය : 60/18

*එදිරිව*

මාරසිංහ පේඩිගේ ජගත්,
134/C/2, මල්කෝන, පෙතියගොඩ, ගම්පහ.

වනසිංහගේ චාන්දනී,
134/C/2, මල්කෝන, පෙතියගොඩ, ගම්පහ.

.................*විත්තිකරුවන්.*

වර්ෂ 2014.04.30 දින වන විට විත්තිකරු විසින් ගෙවිය යුතුව ඇති මූලික ණය ශේෂය මත රුපියල් පන්ලක්ෂ හතලිස් දෙදහස් හත්සිය හැත්තෑ හතයි ශත තිස්තුන (රු. 542,777.33) ක් සහ 2014.05.01 දින සිට එකී රුපියල් පන්ලක්ෂ හතලිස් දෙදහස් හත්සිය හැත්තෑ හතයි ශත තිස්තුන (රු. 542,777.33) ක මුදල මත වාර්ෂිකව 20% ක් වූ පොළියක් ද, එකී දින සිටම විත්තිකරු විසින් නිසි පරිදි වාරික නොගෙවීම මත එකතු වී ඇති හිඟ වාරික මුදල් වන රුපියල් දෙලක්ෂ විසි දෙදහස් දෙසිය හැත්තෑ අටයි ශත අනූ දෙක (රු. 222,278.92) ක මුදලක් ද, 2024.04.30 වන දිනට එකී හිඟ වාරික මුදල් සඳහා එකතු වී ඇති 16% බැගින් වූ අමතර පොළිය වන, රුපියල් විසිපන්දහස් පන්සිය විසි හතයි ශත නවය (රු. 25,527.09) ක මුදලක් ද, 2014.05.01 වැනි දින සිට එකී හිඟ වාරික මුදල් වන රුපියල් දෙලක්ෂ විසි දෙදහස් දෙසීය හැත්තෑ අටයි ශත අනූ දෙක (රු. 222,278.92) ක මුදල සහ ඉදිරියට නොගෙවා පැහැර හරිනු ලබන වාරික මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වනතුරු එකී මුදල මත වාර්ෂිකව 16% බැගින් වූ අමතර පොළියක් ද තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට සම්පූර්ණ මුදල ම අය කර ගන්නා දිනය තෙක් එකී මුදල මත නෛතික පොළියද, නඩු ගාස්තු ද ඇස්කීසි ගාස්තු සහ වෙනත් වියදම් ද පැමිණිලිකරුට අයකර ගැනීම සඳහා ඉහත නම සඳහන් විත්තිකරුවන්ට අයත් මා විසින් තහනමට ගනු ලැබූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් ඔවුන්ට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම්,

**වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 04 වැනි දින** එම දේපළ පිහිටි ස්ථානයේදී **පෙ. ව. 11.00 ට,**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ කොරස ග්‍රාමයෙහි මල්කෝන වත්ත නැමැති ඉඩමට 2006.12.30 දින කේ. කේ. ඒ. එස්. පද්මිණි මානක තැන විසින් මැන සම්පාදිත අංක. 5920 පිඹුර ප්‍රකාර කැබලි අංක 1 ට මායිම්, උතුරට : වාමින්ද කුමාරසිංහට අයිති ඉඩම ද, නැගෙනහිරට : ඥාණරත්නට අයත් ඉඩම ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද සහ බටහිරට : එම්. පී. රංජිත් නිමල්සිරිගේ උරුමකරුවන්ට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාසයයි දශම එකක (පර්. 16.1) වපසරියකින් යුතු මෙම ඉඩම ද ඊට අයත් සියලු දේ ද සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A379/32 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් තැන
දිසා අධිකරණය - ගම්පහ.

11-19

---

**කොළඹ දී (පැවැත්වෙන) බස්නාහිර පළාතේ (සිවිල්) මහාධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 03, ගාලු පාරේ, අංක 450, දරන ස්ථානයේ සහ/හෝ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය සහ/හෝ මීනුවන්ගොඩ, වේයන්ගොඩ පාර, අංක. 42 යන ලිපිනයෙහි “මීනුවන්ගොඩ ශාඛාව” යනුවෙන් හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් පිහිටා ඇති පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී.,
(Pan Asia Banking Corporation PLC)

*................පැමිණිලිකරු.*

නඩු අංකය : CHC/00352/2016/MR
වටිනාකම : රු. 8,715,050/85
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
ඇස්කිසි අංකය : 14/2024

*එදිරිව*

නිශාන්ත චින්තක කිත්සිරි රිල්ලපල ලියනගේ
(එන් එල් ඔටෝ ට්‍රේඩර්ස් යන නාමය හා විලාශය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ.)
අංක 167, වේලුවන පාර,
දෙමටගොඩ,
කොළඹ 09.

*.................විත්තිකරු.*

වර්ෂ 2022ක්වූ ඔක්තෝබර් මස 21 වැනි දින දී කොළඹ සිවිල් මහාධිකරණයේ නඩු තීන්දුව අනුව එකී පැමිණිලිකරුට ඉහත විත්තිකරුගෙන් අයකර ගැනීමට ඇති ණය පහසුකම මත රු. 3,152,897.59 ක් වූ මුදලක් සහ මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින සිට රු. 3,000,000.00 ක් වූ මුදල මත වර්ෂයකට 20.5% බැගින් වූ පොළියක් ද, සහ රු. 5,562,153.26 ක මුදලක් සහ 2016 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් රු. 5,562,153.26 ක මුදලක් මත වර්ෂයකට 16.50% ක් බැගින් වූ පොළියක් ද පැමිණිලිකරුට ගෙවන ලෙසද,

එකී රු. 3,152,897.59 ක් වූ මුදලක් සහ මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂ 2016.04.05 වැනි දින සිට රු. 3,000,000.00 ක් වූ මුදල මත වර්ෂයකට 20.5% බැගින් වූ පොළියක්ද, සහ රු. 5,562,153.26 ක මුදලක් සහ 2016.04.01 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් රු. 5,562,153.26 ක මුදලක් මත වර්ෂයකට 16.50% ක් බැගින් වූ පොළියක්ද අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. එම්. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.08.27 වැනි දිනැති අංක 1838 දරන උකස්කරයෙහි උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2024 දෙසැම්බර් මස 05 වැනි දින ප.ව. 1.00 ට,**

මා විසින් තහනමට ගන්නා ලද ගෝනගහ II අංක 219 ඒ දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගෝනගහ ගමෙහි පිහිටා ඇති “කොස්ගහවත්ත සහ ගෝනගහවත්ත” නමින් හඳුන්වන මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපළ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනගහ II අංක 219 ඒ දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගෝනගහ ගමෙහි පිහිටා ඇති "කොස්ගහවත්ත සහ ගෝනගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන, ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එච්. මෙරිල් බී. පෙරේරා විසින් සකසන ලද වර්ෂ 1999.09.05 දිනැති අංක 350 දරන පිඹුරේ, ලොට් 2 යනුවෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම් : උතුරට : මොහොට්ටිගේ දෝන ලිලීනෝනාට සහ අනෙකුත් අයගේ කුඹුර වෙන් කරනු ලබන කාණුව ද, නැගෙනහිරට : මුලින් මොහොට්ටිගේ දොන් ඒබ්‍රහම් අප්පුහාමිගේ ඉඩම ද, දකුණට : පාර ද, සහ බස්නාහිරට : ලොට් 1 ද මහින් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහතුනයි දශම දෙක (අ.0, රූ.2, පර්.13.2) ක් වූ ඉඩම් කැබැල්ල වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්‍ඉරු P 9/35 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සිවිල් මහාධිකරණය - කොළඹ.

වර්ෂ 2024ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින දී ය.

11 - 55

---

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 03, ගාලු පාරේ, අංක 450, දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන සහ රාජගිරිය, කෝට්ටේ පාර, අංක 468 දරන ස්ථානයේ "රාජගිරිය ශාඛාව" යනුවෙන් හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් පිහිටා ඇති පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී.
(Pan Asia Banking Corporation PLC)

*............පැමිණිලිකරු.*

නඩු අංකය : DMB/00081/2014
ස්වභාවය : උකස්
කාර්යපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 1,168,935.26

*එදිරිව*

1. ලුසියස් ජයන්ත ප්‍රනාන්දු
අංක 1003/5, උද්‍යාන පටුමග,
රාජගිරිය

2. මෙලනී රාජශ්‍රී ප්‍රනාන්දු
අංක 1003/5, උද්‍යාන පටුමහ,
රාජගිරිය

*.............විත්තිකරුවන්.*

ඉහත නඩුවේ වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දින කොළඹ දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව, එකී පැමිණිලිකරුට ඉහත විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට ඇති තීන්දු ප්‍රකාශිත මුදල වන,

රු. 2,204,842.82 ක මුදලක් ද, වර්ෂ 2013.07.01 වැනි දින සිට රු. 1,680,000.00 ක මුදලක් මත වර්ෂයකට 23% ක පොළියක් ද, එකී මුදල ඉක්මවා යන අයිරා මුදල මත 34% ක වැඩිපූර පොළියක් ද, නඩු තීන්දුවේ දිනයේ සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල නෛතික පොළිය ද විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද අංක 2250 දරන උකස්කරයෙහි උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 06 වැනි දින ප. ව. 2.00 ට,**

මා විසින් තහනමට ගන්නා ලද නිශ්චල දේපළ පිහිටි අංක 201, යටිනුවර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාමුඩාවෙල පිහිටි "දෙණියේඅරඹ" නමැති පහත උපලේඛනයේ සඳහන් ඉඩම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටි නුවර, මාමුඩාවෙල පිහිටි "දෙණියේඅරඹ" නමැති ඉඩමට, බලයලත් මානක එම්. ඩබ්ලිව්. ඒ. බී. කිරිදෙන විසින් මැන සාදන ලද 1988.03.25 දිනැති අංක 3505 දරන පිඹුරට අනුව ලොට් "1" සහ "2" වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර එකිනෙක යාබදව පිහිටි ඉඩම් කැබලි වේ. ඉහත කී ඉඩමට මායිම් උතුරට : දිසානායක සහ තවත් අයට අයිති නත්තරන්පොතේ වත්ත නැගෙනහිරට : දෙණියේ අරඹ *නොහොත්* ආරියරත්න යන අයට අයිති කිරිසඳුවගේ ඉඩම දකුණට : පොදු පාර ද, බටහිරට : ගුණසිංහ යන අයට අයිති ගොරොක් මැඩිල්ලේ වත්ත යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තිහ ( රූ.1, පර්. 30) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි යන සියලු දේත් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B/515/35 දරන වෙලුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

මෙම 3505 දරන පිඹුරේ ලොට් 1 සහ 2 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර එකිනෙකට යාබදව පිහිටි ඉඩම් කැබලිවල මෑතක දී කරන ලද නැවත මැනුමක් අනුව,

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටි නුවර, මාමුඩාවෙල කඳුපිට පිහිටි "දෙණියේඅරඹ" නමැති ඉඩමට බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද 2011.09.21 දිනැති අංක 214/11 දරන පිඹුරට අනුව ලොට් 1 දරන කැබැල්ල වේ. ඉහත කී කැබැල්ලට මායිම් උතුරට දිසානායක සහ තවත් අයට අයිති නත්තරන්පොතේ වත්ත නැගෙනහිරට : දෙණියේප අරඹ *නොහොත්* ආරියරත්න යන අයට අයිති කිරිසඳුවගේ ඉඩම දකුණට : පොදු පාර ද බටහිරට ගුණසිංහ යන අයට අයිති ගොරොක් මැඩිල්ලේ වත්ත යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි පහ (රූ.1, පර්.25) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි යන සියලු දේත් වේ.

ඒ. ඒ. එන්. සී. අලුත්ගම,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු,
දිසා අධිකරණය,
මහනුවර.

වර්ෂ 2024ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින දී ය.

11 - 56

---

**මාරවිල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

නඩු අංකය : 345/MB
ඇස්කිසි අංකය : 51/2024

*..................පැමිණිලිකරු.*

*එදිරිව*

1. මෙත්තසිංහ ආරච්චිගේ ඇන්ටනී සෙබස්තියන් ප්‍රනාන්දු (මියගිය)
අංක 29/6, උ/සිරිගම්පල,
ලුණුවිල.

1.(අ) මෙත්තසිංහ ආරච්චිගේ චතුරි චාමිනී ප්‍රනාන්දු
අංක 29/6, උ/සිරිගම්පල,
ලුණුවිල.

1. (ආ) මෙත්තසිංහ ආරච්චිගේ චමරි චාමිනී ප්‍රනාන්දු
අංක 4/75, සන්තානාපුර,
ලුණුවිල.

1.(ඇ) මෙත්තසිංහ ආරච්චිගේ චමිලා චාන්දනී ප්‍රනාන්දු,
අංක 1/252, සෙන්මරිනෝ ගාර්ඩන්ස්,
පහළ හත්තිනිය, මාරවිල.

2. මෙත්තසිංහ ආරච්චිගේ චරිත් චතුරංග ප්‍රනාන්දු,
අංක 29/6, උ/සිරිගම්පල,
ලුණුවිල.

*....................විත්තිකරු.*

මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2024.02.26 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව 345/MB දරන නඩුව සඳහා ඉහත නම් සඳහන් විත්තිකරු එකඟ වූ රු. 1,944,460.50 ක මුදල ගෙවීම පැහැර හැර විත්තිකරු සමථය කඩකර ඇති බැවින් එකී සමථය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ දැක්වෙන පරිදි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු නඩු නිමිත්ත මත 2018.06.01 දිනට රු. 1,077,691.83 ක මුදලක් සහ රු. 1,077,691.83 ක මුදල මත 2018.06.01 දින සිට 11.5% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොළියක් සහ වෙන්දේසි ගාස්තු අයකර ගැනීම සඳහා මෙම අධිකරණය මඟින් නිකුත් කර ඇති ඇස්කීසි ආඥාව ප්‍රකාරව තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළෙහි එම විත්තිකරුවන්ට අයත් සියලුම හිමිකම් හා අයිතිවාසිකම්,

**වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 18 දින පෙ.ව. 11.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව සියල්ලන්ටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ඉඩමට පිවිසීම.-*

වෙන්නප්පුව හන්දියේ සිට වෙන්නප්පුව - කිරිමැටියාන මාර්ගය ඔස්සේ කි. මී. 2.9 ක් පමණ ගමන් කර ලුණුවිල හන්දියට ළඟා වේ. ඉන්පසු වමට හැරී සිරිගම්පොල පාරට ගොස් ප්‍රදීපා ක්‍රීඩාපිටිය පසුකරමින් කි. මී. 1.5 ක් පමණ දුරින් දකුණු පසින් සිරිගම්පල දේවස්ථානය දක්වා ගමන් කරන්න. මෙම ස්ථානයේ සිට බිෂොප් එඩ්මන් පීරිස් මාවතට දකුණට හැරී මීටර් 900 ක් පමණ මෙම මාර්ගයේ ගමන් කර වමට හැරී ලාන්ස් බොම්බාඩියර් ටී. ඒ. ෂහොන් ධනුෂ්ක තේනුවර රණවිරු මාවතට පිවිසෙන්න. ඉන්පසු මීටර් 20 ක් පමණ ඉදිරියට ගොස් වම් පස මාර්ගයට හැරී තවත් මීටර් 50 ක් පමණ ගමන් කර දකුණු පසින් ඇති ප්‍රාදේශීය සභා මාර්ගයට ළඟා විය හැකිය. ඉන්පසු මෙම මාර්ගයේ දකුණට හැරී මීටර් 150 ක් පමණ ගමන් කරන්න. සුරැකුම් දේපළ මෙම මාර්ගයට මුහුණලා දකුණු පස පිහිටා ඇත.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, දකුණු පිටිගල් කෝරලයේ, ඕනර පළාත ලෙස දක්වා තිබුණද, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, ලුණුවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, ලුණුවිල නමැති ගමේ පිහිටි, කිරිමැටියානවත්ත අංක 06 නමැති ඉඩමට, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පු. 3247 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 53 දරන ඉඩම් කොටසට මායිම් .....

උතුරට : කැබලි අංක 50 දරන ඉඩම් කොටස ද,
නැගෙනහිරට : කැබලි අංක 51 සහ 52 දරන කොටස් ද,
දකුණට : කැබලි අංක 56 දරන කොටසද,
බස්නාහිරට : කැබලි අංක 10 දරන කොටසද,

යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම අටයි අට (පර්.9.88) ක් *හෙවත්* හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි පහ (හෙක්. 0.025) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමඟ වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී/වෙන්/10/72 හි ලියාපදිංචි වී ඇත.

ඉහත ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී ලුණුවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, ලුණුවිල නමැති ගමේ පිහිටි, කිරිමැටියානවත්ත, අංක 06 නමැති ඉඩමට, ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු බලයලත් මානක තැන විසින් 2015.02.18 වැනි දින මැන සාදන ලද අංක 12517 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්.

උතුරට : අංක පී. පී. පු. 3247 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 50 දරන කොටස ද,
නැගෙනහිරට : අංක පී. පී. පු. 3247 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 51 හා ලොට් අංක 52 දරන කොටස් ද,
දකුණට : අංක පී. පී. පු. 3247 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 56 දරන කොටස ද,
බස්නාහිරට : අංක පී. පී. පු. 3247 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 10 දරන ප්‍රාදේශීය සභා පාර ද,

යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම නවය (පර්. 9.9) ක් *හෙවත්* හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි පහයි බින්දුව (හෙක්. 0.025) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේත් මේ සමඟ වේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 9.9

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ගරු දිසා අධිකරණය,
මාරවිල.

2024ක් වූ ඔක්තෝබර් මස 09 වැනි දින දී ය.

11 - 57

---

**මාරවිල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

නඩු අංකය : 391/MB
ඇස්කිසි අංකය : 52/2024

..................*පැමිණිලිකරු.*

*එදිරිව*

සේනාධීරගේ ප්‍රියන්ති නිර්මලී,
අංක 166, දෙවන පටුමග,
සිරිගම්පල ජනපදය, ලුණුවිල.

ඉහත විත්තිකරුගේ ඇටර්නි බලකරු ලෙස,
විල්ලප් ප්‍රැන්සිස්කුගේ රංජනී සෝයිස්,
අංක 166, දෙවන පටුමග,
උදාසිරිගම, ලුණුවිල.

................*විත්තිකරුවන්.*

මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2023.05.17 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද ඒකපාර්ශ්වික තීන්දුව ප්‍රකාරව 391/MB දරන නඩුව සඳහා ඉහත නම් සඳහන් විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු 2019.11.15 දිනට රු. 2,857,525.52 ක මුදල සහ රු. 2,349,746.05 ක මුදල මත 2019.11.15 දින සිට 18.5% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවීම පැහැර හැර ඇති බැවින් එකී ඒකපාර්ශ්වික තීන්දුව ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ දැක්වෙන පරිදි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු 2019.11.15 දිනට රු. 2,857,525.52 ක මුදල සහ රු. 2,349,746.05 ක මුදල මත 2019.11.15 දින සිට 18.5% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොළිය සහ වෙන්දේසි ගාස්තු අයකර ගැනීම සඳහා මෙම අධිකරණය මඟින් නිකුත් කර ඇති ඇස්කිසි ආඥාව ප්‍රකාරව තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළෙහි එම විත්තිකරුට අයත් සියලුම හිමිකම් හා අයිතිවාසිකම්,

**වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 04 දින පෙ.ව. 11.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව සියල්ලන්ටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ඉඩමට පිවිසීම.-*

වෙන්නප්පුව නගර මධ්‍යයේ සිට කොළඹ - පුත්තලම A3 මාර්ගයේ කි. මී. 1.5 ක් දුරින් පිහිටි සුසේ පාර දක්වා ගමන් කර, එම පාරේ දකුණට හැරී මීටර් 600 ක් පමණ ඉදිරියට ගොස් හමුවන ප්‍රජා ශාලාව පාරේ මීටර් 100 ක් පමණ ගොස් නැවත දකුණට හැරී මීටර් 150 ක් ගිය විට දකුණු පසින් සුරුකුම් දේපළ පිහිටා ඇත.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, දකුණු පිටිගල් කෝරළයේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, උතුරු කොලින්ජාඩිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, කොලින්ජාඩිය නමැති ගමේ පිහිටි, සියඹලාගහවත්ත, හික්ගහවත්ත, කජුගහවත්ත, මෝලවත්ත නමැති ඉඩමට, එස්. පී. රණසිංහ බලයලත් මානක තැන විසින් 2006.08.08 වැනි දින මැන සාදන ලද අංක 2602 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 67 දරන කොටසට මායිම්......

උතුරට : ඉහත පිඹුරේ ලොට් අංක 69 දරන 6.0 ක් පළල පාර ද,
නැගෙනහිරට : ඉහත පිඹුරේ ලොට් අංක 68 දරන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට වෙන්කළ බිම ද,
දකුණට : ජී. ජෙරාඩ් ප්‍රනාන්දු හා තවත් අයට අයිති ඉඩම ද,
බස්නාහිරට : ඉහත පිඹුරේ ලොට් අංක 49 දරන කොටස ද,

යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බින්දුවයි දශම අටයි බින්දුව (රූඩ්.01, පර්. 0.80) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමඟ වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 108/259 හි ලියාපදිංචි වී ඇත.

ඉහත ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී කොලින්ජාඩිය නමැති ගමේ පිහිටි, සියඹලාගහවත්ත, කජුගහවත්ත, හික්ගහවත්ත සහ මෝලවත්ත නමැති ඉඩමට, ඩබ්. එල්. එච්. ප්‍රනාන්දු බලයලත් මානක තැන විසින් 2012.03.20 වැනි දින මැන සාදන ලද අංක 10710 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම් :

උතුරට : එස්. ජී. රණසිංහ බලයලත් මානක තැනගේ අංක 2602 දරන පිඹුරේ ලොට් අංක 69 දරන පාර ද,
නැගෙනහිරට : එස්. ජී. රණසිංහ බලයලත් මානක තැනගේ අංක 2602 දරන පිඹුරේ ලොට් අංක 68 කොටස ද,
දකුණට : ජී. ජෙරාඩ් ප්‍රනාන්දු හා තවත් අයට අයිති ඉඩම ද,
බස්නාහිරට : එස්. ජී. රණසිංහ බලයලත් මානක තැනගේ අංක 2602 දරන පිඹුරේ ලොට් අංක 49 කොටස ද,

යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බින්දුවයි දශම අටයි බින්දුව (රූඩ් 01, පර්. 0.80) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමඟ වේ.

ඉහත ඉඩමට ප්‍රවේශවීමට ඇති සියලුම පාරවල් ගමනාගමනය සඳහා පොදුවේ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම ද මේ සමඟ වේ.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 01, පර්චස් 0.80

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ගරු දිසා අධිකරණය,
මාරවිල.

වර්ෂ 2024ක් වූ ඔක්තෝබර් මස 09 වැනි දින දී ය.

11 - 58

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතු ය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2024.11.01 | සිකුරාදා | 2024.10.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.08 | සිකුරාදා | 2024.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.14 | බ්‍රහස්පතින්දා | 2024.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.22 | සිකුරාදා | 2024.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.29 | සිකුරාදා | 2024.11.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2024.12.06 | සිකුරාදා | 2024.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.13 | සිකුරාදා | 2024.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.20 | සිකුරාදා | 2024.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.27 | සිකුරාදා | 2024.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2025 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2025.01.03 | සිකුරාදා | 2024.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.10 | සිකුරාදා | 2024.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.17 | සිකුරාදා | 2025.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.24 | සිකුරාදා | 2025.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.31 | සිකුරාදා | 2025.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.